# සංස්කෘත ශබ්ද ප්‍රකෘති සිංහල ගැමි වහරට විකාශය වීමේ දී දක්නට ලැබෙන විශේෂතා

පූජ්‍ය කථිකාචාර්ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි, වාග්විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ABSTRACT

සංස්කෘත භාෂාව භාෂණ භාවිතයක් ලෙස ශ්‍රී ලංකාව තුළ භාවිත වූ බවට කිසිදු සාධකයක් නැතත් සිංහලයට එය මාතෘ භාෂාවක් වූ බවට විවාදයක් නැත. සිංහල ගැමියා මෙසේ සංස්කෘතයෙන් ලද වාග් ව්‍යවහාරයන් තමාට හුරු ආකාරයට සකසා ගත්තේය. එහි දී ශබ්ද විද්‍යාත්මක ව එකී භාවිතයන් විකාශනය වූ අයුරු ශාස්ත්‍රීය අධ්‍යයනයට ගෝචර විෂයකි. පහත ඇති නිදසුන් සලකා බලන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| karmə | > | karume | rm | > | rum |
| | | | ə | > | ɛ |
| dharmə | > | darume | dh | > | d |
| | | | rm | > | rum |
| | | | a | > | e |
| a:bhaṣə | > | a:ba se | bh | > | b |
| | | | a | > | a: |
| | | | ə | > | e |
| swabhawə | > | soba:we | sw | > | so |
| | | | bh | > | b |
| | | | a | > | a: |
| | | | a | > | e |
| šari:r | > | sxri::re | š | > | s |
| | | | a | > | x |
| | | | a | > | e |
| prasthaw | > | parasta:w | pr | > | par |
| | | | th | > | t |